**ශීර්ෂය 238 - රාජ්‍ය මුලා ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**

රාජ්‍ය මුලා ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මුලා වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම, ආදායම් ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2016 දෙසැම්බර් 05 දින දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වි ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම**

විසර්ජන ගිණුම, ආදායම් ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මුලා හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරිම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

**2.1 විසර්ජන ගිණුම**

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

දෙපාර්තමේන්තුව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 78.38 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 72.66ක් උපයෝජනය කර තිබුණු අතර දෙපාර්තමේන්තුව වෙත සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 5.72 ක් හෙවත් සියයට 7.30 ක් ඉතිරි වි තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2015 දෙසැම්බර් 31දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | |
| පුනරාවර්තන | 75.88 | 70.43 | 5.45 | 7.18 |
| මුලධන | 2.50 | 2.23 | 0.27 | 10.80 |
| **එකතුව** | **78.38** | **72.66** | **5.72** | **7.30** |

## 2.2 ආදායම් ගිණුම්

රාජ්‍ය මුල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව විසින් 2015 වර්ෂය සඳහා ආදායම් සංකේත 02 ක් සඳහා එකතුව රු.මිලියන 12,005 ක ආදායම් ඇස්තමේන්තු කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී ඉන් එක් ආදායම් සංකේතයකින් පමණක් රු.මිලියන 21.36 ක ආදායම් රැස්කර තිබුණි. එය එම ආදායම් සංකේතයට අදාළ ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 327.20 ක් වී තිබුණි. අනෙක් ආදායම් සංකේතයෙන් කිසිදු ආදායමක් රැස්කර නොතිබුණි. විස්තර පහත දැක්වේ.

| ආදායම් සංකේතය | 2015 දෙසැම්බර් 31 දිනට | | | ඉක්මවීම/ (ඌනතාවය) ඇස්තමේන්තුගත ආදායමේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය ආදායම | ඉක්මවීම/ (ඌනතාවය) | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| 10.02.10.00 | 5.00 | 21.36 | 16.36 | 327.20 |
| 20.05.01.00 | 12,000.00 | - | (12,000.00) | (100.00) |
| **එකතුව** | **12,005.00** | **21.36** | **(11,983.64)** | **(99.82)** |

## 2.3 රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දෙපාර්තමේන්තුවට අදාළ විෂය අංක 23801 යටතේ රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 2.72 | 0.99 | 1.00 | 1.70 | 10.00 | 6.56 |

## 2.4 විගණන නිරීක්ෂණය

රාජ්‍ය මුල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම, ආදායම් ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

-----------------------------------------------

### 3.1 ආදායම් ගිණුම්

----------------

දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා, ආදායම් ගණන්දීමේ නිලධාරි වශයෙන් ආදායම් සංකේත 02 ක ආදායම් ඇස්තමේන්තු පිළියෙල කිරිම, ආදායම් රැස්කිරිම, ගිණුම්ගත කිරිම හා ගිණුම් ඉදිරිපත් කිරීමේ කාර්ය භාරය පැවැරි තිබුණි. එම ආදායම් සංකේතවලට අදාළව සිදු කළ නියැදි විගණනයේදී පහත සඳහන් අඩුපාඩු නිරික්ෂණය විය.

**(අ) 10.02.10.00 දරන ආදායම් සංකේතය - සමාජ වගකිම් බද්ද**

-------------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2015 දෙසැම්බර් 29 දිනැති අංක 247/2015 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව 2015 වර්ෂය සඳහා වූ ආදායම් ගිණුම 2016 මාර්තු 31 දිනට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, මාසයකට අධික කාල පමාවකින් පසුව 2016 මැයි 02 දින විගණනය වෙත ඉදිරිපත් කර තිබුණි.

(ii) සමාලෝචිත වර්ෂයේ මුල් ආදායම් ඇස්තමේන්තුව රු.මිලියන 5.00 ක් වී තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විට රු.මිලියන 21.36 ක ආදායම් රැස්කර තිබුණි. එය ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 327.20 ක් වී තිබුණි.

(iii) ආදායම් සංකේතයට අදාළව ශ්‍රී ලංකා රේගුව හා දේශිය ආදායම් දෙපාර්තමේන්තුව විසින් 2015 දෙසැම්බර් 31 දින වන විට එකතුව රු.82,893,328 ක් වූ හිඟ ආදායම් වාර්තා දෙපාර්තමේන්තුව වෙත එවා තිබුණි. ඒ අනුව, මෙම ආදායම් සංකේතයේ හිඟ ආදායම රු.82,893,328 ක් වී තිබුණි. නමුත් ආදායම් ගිණුමේ ඇතුළත් කර තිබුණු හිඟ ආදායම රු.61,537,332 ක් වී තිබුණි. ඒ අනුව රු.21,355,996 ක හිඟ ආදායම් ගිණුමේ අඩුවෙන් සඳහන් කර තිබුණි. කෙසේ වුවද, දෙපාර්තමේන්තුව විසින් හිඟ ආදායම් අයකර ගැනීමේ ප්‍රගතිය දුර්වල තත්ත්වයක පැවැතුණි.

**(ආ) 20.05.01.00 දරන ආදායම් සංකේතය - මහ බැංකු ලාභ**

-----------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i). පසුගිය වර්ෂයේ මහ බැංකු ලාභ වශයෙන් රැස් කරන ලද ශුද්ධ ආදායම රු.මිලියන 11,500 ක් වී තිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා රු.මිලියන 23,000 ආදායම් ඇස්තමේන්තු කර තිබුණු අතර පසුව එම ආදායම රු.මිලියන 12,000 ක් දක්වා ආදායම් ඇස්තමේන්තුව සංශෝධනය කර තිබුණි. නමුත් සමාලෝචිත වර්ෂයේ කිසිදු ආදායමක් රැස්කර නොතිබුණි.

(ii). සමාලෝචිත වර්ෂයේදී ශ්‍රී ලංකා මහ බැංකුව ලාභාංශ ප්‍රකාශ කර නොතිබුණු බැවින් ආදායම් ගිණුමට අදාළ ආදායම් නොතිබුණි.

**3.2 රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම**

දෙපාර්තමේන්තුවට අදාළ විෂය අංක 23801 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳව 2015 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

2002 මැයි මාසයේදී පළාත් සභාවකට ස්ථාන මාරු වී ගිය නිලධාරිණියකගේ රු.85,378 ක ණය ශේෂය 2015 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන ජාතික අයවැය චක්‍රලේඛ ප්‍රකාරව අදාළ පළාත් සභාවෙන් මුදලින් එකවර අයකර ගත යුතුව තිබුණි. එම ණය ශේෂය සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අයකර ගැනිමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

**3.3 අනුකූල නොවීම**

**නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නිති, රීති හා රෙගුලාසිවලට යොමුව | | | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|---|---|
| (අ) | මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ චක්‍රලේඛ | | | |
| | (i) | 2010 ඔක්තෝබර් 10 දිනැති අංක මු.ක්‍ර.අ.01/2010/01 දරන චක්‍රලේඛය | රු. 382,162 එක්සත් ජනපද ඩොලර් 1600 | විදේශගත වූ නිලධාරින්ට හිමි අනියම් දීමනාව එම රජය හෝ ප්‍රදායක ආයතනය විසින් ගෙවා තිබුණත්, ඒ පිළිබඳව නොසලකා දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු නිලධාරින්ට අවස්ථා 05 කදී එක්සත් ජනපද ඩොලර් 1600 ක් හා රු.382,162 ක් ගෙවීම් කර තිබුණි. |
| | (ii) | - එම - | රු.126,000 එ.ජ.ඩොලර් 3,200 | නිලධාරියෙකු ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලයේ පශ්චාත් උපාධි පාඨමාලාවක් හැදෑරීම සඳහා 2015 ජනවාරි 04 දින සිට 2015 දෙසැම්බර් 24 දින දක්වා අධ්‍යයන නිවාඩු ලබා විදේශගත වීම සඳහා ගුවන් ගමන් ප්‍රවේශ පත්‍ර ගාස්තුව ලෙස රු.126,000 ක් හා දින 10 ක් සඳහා අනියම් හා සංයුක්ත දීමනා ලෙස එ.ජ.ඩොලර් 3200 (400 + 2800) ක් දෙපාර්තමේන්තුව විසින් ගෙවා තිබුණි. ඊට අදාළව ලබාගත් අනුමැතියක් ලිපිගොනුව තුළ නොතිබුණි. |

**(ආ) අයවැය චක්‍රලේඛ**

| | | |
|---|---|---|
| 2010 දෙසැම්බර් 07 දිනැති අංක 150 දරන චක්‍රලේඛය | රු.මිලියන 7.4 | මූල්‍යා කල්බදු ක්‍රමය යටතේ අධ්‍යක්ෂ ජනරාල්වරයෙකුට මිලදී ගත හැකි නිෂ්පාදන බදු සහ රේගු බදු රහිත වාහනයක උපරිම වෙළඳපොල මිල රු.මිලියන 4 ක් වුවද, අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත අනුයුක්ත කර තිබුණු වාහනයේ වටිනාකම රු.මිලියන 7.4 ක් විය. |

## 3.4 කාර්යසාධනය

2015 වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම අනුව, දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය පිළිබඳ පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

(අ) 2015 වර්ෂය සඳහා පහත විස්තර සඳහන් ආදායම් සංකේතවලට අදාළ ආදායම් ඇස්තමේන්තු, ආදායම් ගණන්දීමේ නිලධාරීන් විසින් දෙපාර්තමේන්තුව වෙත එවා තිබුණි. එසේ එවා තිබුණු ආදායම් ඇස්තමේන්තුවල රැස්කිරිමට අපේක්ෂා කළ ආදායමේ එකතුව රු.මිලියන 128,138 ක් වි තිබුණි. එසේ එවා තිබුණු ඇස්තමේන්තුගත ආදායම් දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික අයවැය ඇස්තමේන්තුව පිළියෙල කිරීමේදි රු.මිලියන 63,033 කින් වැඩි කර රු.මිලියන 191,138 ක් වශයෙන් දක්වා තිබුණි. විස්තර පහත දැක්වේ.

| ආදායම් සංකේතය | ආදායම් ගණන්දීමේ නිලධාරීගේ ඇස්තමේන්තුව රු.මිලියන | අතුරු සම්මත අයවැය ඇස්තමේන්තුව රු.මිලියන | වෙනස රු.මිලියන |
|---|---|---|---|
| 20.02.02.01 | 6,221 | 6,725 | 500 |
| 20.02.01.99 | 60 | 300 | 240 |
| 20.02.01.01 | 650 | 700 | 50 |
| 10.02.11.00 | 29,000 | 40,000 | 11,000 |
| 20.02.02.99 | 1,300 | 1,500 | 200 |
| 20.03.02.99 | 7,000 | 8,990 | 1,990 |
| 20.03.99.00 | 4,000 | 15,000 | 11,000 |
| 20.06.04.00 | 14,077 | 14,300 | 223 |
| 30.01.01.00 | 16,000 | 30,000 | 14,000 |
| 20.02.03.00 | 30,680 | 45,500 | 14,820 |
| 20.02.04.00 | 5,050 | 5,160 | 110 |
| 20.04.01.00 | 9,100 | 15,000 | 5,900 |
| 20.04.02.00 | 5,000 | 8,000 | 3,000 |
| **එකතුව** | **128,138** | **191,175** | **63,033** |

(ආ) 2015 ජුලි 20 දිනැති අංක 01/2015 දරන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛය ප්‍රකාරව, ආදායම නිවැරදිව පුරෝකථනය කිරීම ඉතා වැදගත් බව සඳහන් කර තිබුණි. එසේම රාජ්‍ය ආදායම හා ලැබීම් ඇතුළත් රාජ්‍ය මූල්‍ය පෙලගැස්ම හා රාජ්‍ය මූල්‍ය ක්‍රියාකාරිත්වය කළමනාකරණය ප්‍රධාන කාර්යයක් ලෙස සඳහන් කර තිබුණි. රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව විසින් රජයේ සමස්ථ ආදායම පුරෝකථනය කිරීමේදි එසේ ක්‍රියා කර නොතිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂයේ මුල් ඇස්තමේන්තුගත ආදායම හා වර්ෂයේදී රැස්කළ තථ්‍ය ආදායම අතර සියයට 10 ක සිට සියයට 1968 ක් දක්වා පරාසයක ප්‍රමාණයන්ගෙන් වෙනස්කම් පැවැතුණි.

(ii) සමාලෝචිත වර්ෂයේ සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව හා වර්ෂයේදී රැස්කළ තථ්‍ය ආදායම අතර සියයට 10 ක සිට 120 ක් දක්වා පරාසයක ප්‍රමාණයන්ගෙන් වෙනස්කම් පැවැතුණි.

(iii) ප්‍රාදේශීය සභා සඳහා මූලික හා සංශෝධිත ඇස්තමේන්තු සකස් කර තිබුණද, තථ්‍ය ආදායම් විස්තර වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) දෙපාර්තමේන්තුව විසින් සුනාමි සහන ව්‍යාපෘතිය යටතේ එකතු කළ අගය මත බදු නිරවුල් කිරීම සඳහා 2015 වාර්ෂික අයවැය ඇස්තමේන්තුවේ 238-1-1-0-1405 වැය විෂය යටතේ ප්‍රතිපාදන සලසා තිබුණි. අදාළ වියදම් කිරීම සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට බලය පවරා තිබුණි. ඒ අනුව ව්‍යාපෘති 07 ක වෙනුවෙන් රු.32,171,486 ක් වැය කර තිබුණි. එම වියදම් සම්බන්ධයෙන් තොරතුරු ඉල්ලා තිබුණත්, අදාළ ලිපිගොනු ලේඛණාගාරය වෙත ඉදිරිපත් කළ බව සඳහන් කර එක් ලිපිගොනුවක් පමණක් විගණනයට ඉදිරිපත් කර තිබුණි. 2005 නොවැම්බර් 16 දිනැති අංක FP/06/20/13/136 දරන එම ලිපිගොනුවේ සඳහන් ලිපියකට අනුව සුනාමි ව්‍යාපෘතිය සඳහා රු.26,435,521 ක් බදු නිදහස් කිරීමට කල් තබන ලද ලිපියක් හැර වෙනත් කාර්යසාධනයට අදාළ තොරතුරු කිසිවක් ඉදිරිපත් කර නොතිබුණි. නියැදි පදනමක් මත සිදු කළ විගණන පරීක්ෂාවේදී 2005, 2006 හා 2007 වර්ෂවලට අදාළ ඉන්වොයිස් පත් පදනම් කරගෙන පිරිවැය රු. 214,476,573 ක් වූ ව්‍යාපෘති 07 ක් සඳහා සියයට 15 ක එකතු කළ අගය මත බදු වශයෙන් රු. 32,171,486 ක් 2015 වර්ෂයේදි වැය කර තිබුණු බව නිරීක්ෂණය විය.

(ඈ) ක්‍රියාකාරී සැලැස්ම අනුව වර්ෂය පුරා ක්‍රියාත්මක වන දත්ත පද්ධතියක් සකස් කිරීම හා කළමනාකරණය කිරීම කළ යුතුව තිබුණි. නමුත් මෙරටට ගෙන්වනු ලබන භාණ්ඩ සඳහා වත්කම් මත අයකරන එකතු කරන අගය මත බදු (VAT) නිදහස් කිරීම පිළිබඳ දත්ත පද්ධතියක් දෙපාර්තමේන්තුව විසින් පවත්වා නොතිබුණු බව නිරීක්ෂණය විය.

## 3.5 මතභේදයට තුඩුදෙන ගැටළු

----------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මුදල් අමාත්‍යාංශයේ වාර්ෂික වාර්තාව මුද්‍රණය සඳහා 2012 හා 2013 වර්ෂවලට අදාළ වාර්තාවේ එක් පිටපතක් මුද්‍රණය කිරීමට පිළිවෙලින් රු.3,864 ක් හා රු.3,183 ක් වැය කර තිබුණි. 2014 වර්ෂයේ මුදල් අමාත්‍යාංශයේ වාර්ෂික වාර්තාව මුද්‍රණය කිරීම මුදල් අමාත්‍යාංශය විසින් සිදු කර තිබුණි. ඒ සඳහා එක් වාර්තාවක් මුද්‍රණය කිරීමට රු.1,480 ක් බැගින් වැය කර තිබුණි.

(ආ) විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව, 2013 හා 2014 වර්ෂවල මුදල් අමාත්‍යාංශයේ වාර්ෂික වාර්තා පිළිවෙලින් පිටපත් 2,750 ක් හා 1,800 ක් බෙදාහැරීමකින් තොරව ඉතිරිව පැවැතුණි.

මෙම වාර්ෂික වාර්තා දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ පල කර තිබුණ ද, ඉහත කී 2013 වර්ෂයට අදාළ ඉතිරි වී තිබු වාර්තා Speed Post Courier වෙතින් රු.1,320,000 ක් වැය කර පාසල්වලට බෙදා දී තිබුණි. එසේම, 2014 වර්ෂයට අදාළ ඉතිරි වාර්තා 1800 ක් Speed post සේවාව මගින් විශ්වවිද්‍යාලවලට හා පාසල්වලට බෙදා දීම සඳහා රු. 405,000 ක් වැය කර තිබුණි.

(ඇ) 2014, 2015 හා 2016 වර්ෂවලට අදාළ රාජ්‍ය මූල්‍ය කළමනාකරණ වාර්තා මුද්‍රණය කිරීම දෙපාර්තමේන්තුව විසින්ම සිදු කර තිබුණි. මෙම වාර්තාවක් මුද්‍රණය කිරීම සඳහා 2014 හා 2015 වර්ෂවල පිළිවෙලින් රු.8,449 ක් හා රු.7,967 ක් වී තිබුණි. නමුත් 2016 වර්ෂයේ වාර්තාව මුද්‍රණය කිරීම සඳහා ඒකක පිරිවැය රු.495 ක් දක්වා අඩු වී තිබුණි. 2014 හා 2015 වර්ෂවලදී මෙම වාර්තා මුද්‍රණය කිරීම පෞද්ගලික ආයතනයක් වෙත භාර දී තිබුණු අතර 2016 දී එය රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව වෙත භාර දී තිබීම නිසා පිරිවැය අවම වී තිබුණි.

(ඈ) විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව, රාජ්‍ය මූල්‍ය කළමනාකරණ වාර්තා 2014 හා 2015 වර්ෂවල පිළිවෙලින් වාර්තා 376 ක් බැගින් ඉතිරි වී තිබුණි.

(ඉ) ඉදිරිපත් කළ තොරතුරු අනුව, 2013 හා 2014 වර්ෂවල, රාජ්‍ය මූල්‍ය කළමනාකරණ වාර්තාව මෙන්ම වාර්ෂික වාර්තා මුද්‍රණයට අදාළව පත්කර තිබු තාක්ෂණික ඇගයීම් කමිටුව හා ප්‍රසම්පාදන කමිටුව සඳහා එකම නිලධාරීන් පිරිසක් පත් කර තිබුණි.

(ඊ) විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව වසර මැද මූල්‍ය කළමනරකරණ වාර්තා 2014 හා 2015 වර්ෂවලදී පිළිවෙලින් වාර්තා 719 ක් හා වාර්තා 1714 ක් ඉතිරිවී තිබුණු අතර පූර්ව මැතිවරණ මූල්‍ය තත්ත්ව වාර්තාව, 2014 හා 2015 වර්ෂවලදී පිළිවෙලින් වාර්තා 487 ක් හා වාර්තා 1367 ක් ඉතිරි වී තිබුණි.

## 3.6 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2015 දෙසැම්බර් 31 දිනට සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිද විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 22 | 13 | 09 |
| (ii) | තෘතියික මට්ටම | 03 | 02 | 01 |
| (iii) | ද්විතියික මට්ටම | 25 | 18 | 07 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 15 | 10 | 05 |
| | **එකතුව** | **65** | **43** | **22** |

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

තථ්‍ය කාර්ය මණ්ඩලය තුළ වූ ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධාරීන් 13 දෙනාද, අවස්ථා 20 කදී දේශීය හා විදේශීය පුහුණු සහ සම්මන්ත්‍රණ සඳහා සහභාගී වී තිබුණු අතර එක් සහකාර අධ්‍යක්ෂවරයෙකු පෞද්ගලික කාරණයක් සඳහා 2015 වර්ෂයේදීම විදේශගත වී තිබුණි.